# (එ) කාර්මික නිෂ්පාදනයේ හැඩ ගැස්ම

1962 දී ලංකාවේ කාර්මික කටයුතු කෙරෙහි නිසැකයෙන්ම ඉක්මන් උනන්දුවක් දක්නට හැකි වුවද, රටේ නිෂ්පාදනය හා රැකීරක්ෂා තත්ත්වය කෙරෙහි, ඒ කෙතෙක් දුරට නියත වශයෙන් බලපා තිබේද යන්න, තක්සේරු කිරීමට තරම් කල් පිරුනේ නොවේ. යොදවනු ලැබූ කාර්මික ආයෝජන වලින් සැහෙන ප්‍රමාණයක් තවමත්, වෙළෙඳාමට කැරෙන නිෂ්පාදන කෙරෙහි යොමු කරවිය යුතුව තිබෙන අතර අර්ථ ක්‍රමයේ මේ අංශයේ, සංඛ්‍යා තොරතුරු වල ඇති ඌන තාවන්, හා සදෙස් බවත් නිසා මේ කාලය තුළ ඇතිවූ කාර්මික හැඩගැස්ම ගැන විචිත්‍රාකාරව කිව හැක්කේ නොවේ. රජයේ කාර්මික සමායතන, සම්බන්ධයෙන් අලුත්ම සංඛ්‍යා තොරතුරු ලැබුනේ වුවද, මුදල් ගිණුම් ඉදිරිපත් කිරීමේ සමානත්වයක් නොමැති නිසා, සංඛ්‍යා තොරතුරු සහ මූළු ගණන් සැසැඳීමේදී, සමහර දුෂ්කරතාවන් උද්ගත වන්නේ ය. අනෙක් අතට පෞද්ගලික අංශයේ කුඩා ව්‍යාපාර, සැහෙන ප්‍රමාණයක් වහ වහා පැන නැගීම නිසා, සංඛ්‍යා තොරතුරු එක් රැස්කර ගැනීම දුෂ්කර වී ඇත. මෙයට එක් හේතුවක් වී ඇත්තේ ඉල්වා යවන සංඛ්‍යා තොරතුරු සැපයීමට, මේ ව්‍යාපාර දක්වන අඩු උනන්දුවයි. එමනිසා වර්තමාන කාර්මික හැඩගැස්ම ගැන පහත දැක්වෙන විස්තරයෙන් බලාපොරොත්තු වන්නේ රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ කාර්මික වර්ධනයේ ප්‍රධාන ලක්ෂණ සමහරක් මතුකොට දක්වා ලීමට පමණෙකි.

## රාජ්‍ය අංශය

රජයේ කාර්මික යෝජනා ක්‍රම පරිපාලන වශයෙන් හා ශිල්පීමය වශයෙන් ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු, පසුගිය වර්ෂය තුළ තවදුරටත් කරගෙන යනු ලැබීය. පුළුල් වී යන වැඩ පිළි වෙළක් උඩ අරමුණු කැරුනේ වුවද, පෙරට වඩා තාත්වික වූ ආයෝජන හා නිෂ්පාදන ඉල්ලකයන් යොදගනු ලැබීය. දැනට ඇති සමායතන බොහෝ ගණනක්ම, කර්මාන්ත අතර වඩාත් කිට්ටු සහයෝගතාවයක් ඇති කර ගැනීමේත්, ඔවුන්ගේ යන්ත්‍රෝපකරණ සම්පූර්ණ ලෙස වැඩට ගැනීමේත්, බලාපොරොත්තුවෙන්, ඒ සඳහා උත්සාහ දරන ලදී. මේ නිසා සමහර සමායතනවල එකිනෙකට සම්බන්ධ නිෂ්පාදන අංශවල ආයෝජන පුළුල් කිරීමට සිදු විය. සමාන්තර ආයෝජ නයන්ගේ, භාණ්ඩ පරිහරණය හා ප්‍රවාහනය වැනි, පොදු කාර්යයන් වැඩි වැඩියෙන් යන්ත්‍රානු-සාරයෙන් කිරීමෙන් නිෂ්පාදන වියදම් තවදුරටත් අඩු කිරීමට යෝජනා කොට ඇත. තෝරා ගත්, රජයේ සමායතන වල වැඩි විස්තර කෙටියෙන් පහත දක්වා ඇත.

### කාර්මික වතු සමායතන

ලංකාවේ ප්‍රථම කාර්මික වත්ත, ඒකල (ජා ඇල දිස්ත්‍රික්කයේ) පිහිටුවා ඇත. අක්කර 70 ක බිම් ප්‍රමාණයකින් යුත් මේ වත්ත, ප්‍රධාන කලාප හතරකට බෙද ඇත. මේ යෝජනා ක්‍රමයෙහි පළමු අවස්ථාව රුපියල් පනස් ලක්ෂයක වියදමින් දැනට නිමාකොට තිබේ. මෙහි අක්කර 25 ක පමණ බිම් වාසියක කුඩා ප්‍රමාණයේ සහ මධ්‍යම ප්‍රමාණයේ කර්මාන්ත 20 ක් පමණ අරඹා ඇත. මේ හැම කර්මාන්තයකටම, කර්මාන්තශාලා ගොඩනැගිල්ලක් ද, කාර්යාලයීය ඉඩ ද, රථවාහන සඳහා ආවරණය කළ සලපතල මළුවක් ද, ප්‍රධාන පාරේ සිට කර්මාන්ත ශාලාවට මාර්ගයද, ඇත්තේය. හැම කර්මාන්ත ශාලාවකටම වතුර, විදුලිය හා කාණු ක්‍රම සපයා ඇත. වත්තේ ඉතිරි කොටස, කර්මාන්ත පෙදෙස් දෙකකට බෙදෙන අතර, එහි අක්කර 31 කින් යුත් කාර්මික අංශයක් සහ අක්කර 14 කින් යුතු සේවා ප්‍රදේශයක් ද වේ. මෙයින් එක අංශයක් විශාල කර්මාන්ත සඳහා වෙයි. අනෙක් අංශයේ එකිනෙකට නොසැමයෙන හම්, සිමෙන්ති වැඩ හා සිදුරු ගඩොල් ආදිය සඳහා කර්මාන්ත ශාලා වෙයි. අධික ශබ්දය හෝ ගඳ හෝ දූවිල්ල නිසා මේ කර්මාන්තශාලා අනෙක්වායින් වෙන්කොට තැනිය යුතු ය.

සමායතනය අනුගමනය කරන ප්‍රතිපත්තිය වනුයේ කාර්මික හැඩ ගැසීමෙහි විවිධාකාරත්ව යක් ඇතිකර ගන්නා අතරම, සැහෙන ප්‍රමාණයක කර්මාන්ත අතර අන්‍යෝන්‍ය පිටිවහල හා අනුපූරකතාවක් පවත්වාගෙන යාමය. අන්‍යෝන්‍ය පිටිවහල, මේ විධියට කර්මාන්ත පිහිටු වීමෙන්, ලැබිය හැකි පිරිමැස්ම වලින් ප්‍රධානතම පිරිමැස්මක් වෙයි. කාර්මික වත්තේ තැනක් ලැබීමට සුදුසු කම් ලැබෙන්නේ කර්මාන්ත අමාත්‍යාංශය විසින් අනුමත කැරුන කර්මාන්ත ගණයට වැටෙන කර්මාන්ත වලට පමණෙකි. මේ සඳහා ගෙවිය යුතු කුලිය ගණන් බලා ඇත්තේ සමායතනයේ වියදම් කපා ගැනීමට සැහෙන සේ පමණෙකි. වත්තේ වැඩ නිමාවූ පසු බැංකුවකින් තැපැල් කන්තෝරුවකින්, ස්වයංකාරී ටැලිෆෝන් මධ්‍යස්ථානයකින් හා කම්කරු නිවාස වලින්, සමන්විත නවීන පන්නයේ කාර්මික වත්තක් බවට ඒ පෙරලෙන්නේය.

කාර්මික වත්තේ වූ ප්‍රථම කොටසේ, කර්මාන්තශාලා 18 ක් ම, භාණ්ඩ වර්ග සැහෙන ගණනක් නිෂ්පාදනයට හා කොටස් සවිකිරීමට, වෙන්කොට ඇත. මේ ව්‍යාපාර වලින් හතක්ම, ළඟදී නිෂ්පාදනය අරඹා ඇත. (1962 ඔක්තෝබර් 1 වැනිදා) පහක් ඒවාට නියමිත ස්ථාන කරා ගොස් ඇත. වෙළෙඳාම සඳහා නිෂ්පාදනය අරඹා ඇති කර්මාන්ත දැනට පළතුරු යුෂ, ජෑම්, ජෙලි සහ වට්නි ද, රේඩියෝ උපකරණ, සූට්කේස්, සහ ගමන් බඩු ද, කාබන් කඩදසි ප්ලාස්ටික් භාණ්ඩ, සහ පහන් ආවරණ ද, බුරුසු සහ තේ පෙට්ටි උපකරණ ද, නිපදවනු ලැබේ. දැනට පටන් ගෙන තිබෙන කර්මාන්ත අතර, අනුපූරක වශයෙන් අවශ්‍ය වන භාණ්ඩ නිපැයෙන කර්මාන්ත අඩුවීමට බොහෝ සෙයින්ම හේතුවී ඇත්තේ, මුලදී කර්මාන්ත තෝරා ගැනීම සඳහා යෙදූ ක්‍රමය තාවකාලිකව ලිහිල් කිරීම විය.

දැනට නිෂ්පාදනය අරඹා ඇති කර්මාන්ත හතෙහි සවිකොට තිබෙන යන්ත්‍රෝපකරණ වල වටිනාකම රුපියල් 7,00,000 ක් පමණ වෙයි. යෙදවීමට බලාපොරොත්තු වන කම්කරු සංඛ්‍යාව 245 කි. කාර්මික වත්තේ ඇරඹීමට බලාපොරොත්තුවන අනෙකුත් කර්මාන්ත 18 යන්ත්‍රෝපකරණ සඳහා රුපියල් තිස් ලක්ෂයක් යෙදෙන අතර, කම්කරුවන් 662 ක් යෙදවීමට බලාපොරොත්තු වෙයි. (ව්‍යාපාර ඉඩකඩ ඉල්ලා සමායතනයට අයැදුම් කළ අවස්ථාවේ සැපැයූ සංඛ්‍යා තොරතුරු අනුවය).

### හම් නිෂ්පාදිත සමායතනය

හම් වැඩ අංශයේ, පාවහන් කම්හලේ නිෂ්පාදනය ඒ ඇරඹූ දින සිටම, සැහෙන ප්‍රමාණයකින් වැඩි වී ඇත. එහෙත් 1962 මෙහි විශේෂ වැඩි වීමෙක් ඇතිවිය. මේ අවුරුද්දේ ක්‍රෝම් හම් වර්ග අඩි 5,11,000 ක් නිපදූ අතර, 1961 දී නිපදවූ ප්‍රමාණය වර්ග අඩි 4,00,000 කටත් අඩුවිය. අනෙක් අතට සපත්තු නිෂ්පාදනය ද පසුගිය අවුරුද්ද හා සසඳන විට 1962 දී දෙගුණයක් පමණ විය. 1962 දී සේවාවේ යෙදවූ මුළු සේවක සංඛ්‍යාව 345 ක් වූ අතර 1961 ගණනට වඩා මෙය සියයට 16 කින් වැඩිය. නිෂ්පාදනයෙහි මේ වෙනස ඇතිවූයේ අලුත් කර්මාන්ත ශාලාවක් ඉදි කිරීම ඇතුළු නිෂ්පාදනය වැඩි කිරීමෙහි ලා පුලුල් වැඩ පිළිවෙළක් ඇරඹීමයි. සමායතනයේ මුළු ප්‍රාග්ධනය 1962 දී රුපියල් කෝටි 0·35 කින් වැඩි කැරිණි. මේ මුදල ණයක් වශයෙන් රජයෙන් ලබා ගන්නා ලදී. මින් වැඩි ප්‍රමාණයක් අලුත් සපත්තු කර්මාන්තශාලාවට දැනටමත් යොදවා ඇති අතර, නිෂ්පාදනය පුළුල් කිරීමේ වැඩ පිළිවෙළේ සම්පූර්ණ බලපෑම 1963 දී ඇතිවිය හැකිය.

සමායතනය 1956 සිටම දිගටම ලාභ ලැබුව ද, අමු ද්‍රව්‍ය මිල සහ වැටුප් ප්‍රමාණයන් විටින් විට අඩු-වැඩි වීමත් සමග, ලැබෙන ලාභයෙහි ද අඩු-වැඩි වීමෙක් ඇති වන්නේය. සමායතනයේ බඩුවල විකුණුම් මිල වැඩි නොකැරුනෙන්, දැනට පවත්නා කම්කරු වියදම හා අමු ද්‍රව්‍ය මිල නිෂ්පාදනය හා විකිණීම පුළුල් කිරීමෙන් ඇතිවූ වාසිය බොහෝ සෙයින් මකාලන තරමට වෙයි. සමායතනයේ නිෂ්පාදනය පුළුල් කිරීමේ වැඩපිළිවෙළට අනුව, රටට අවශ්‍ය සපත්තු සහ හම් භාණ්ඩ, සම්පූර්ණයෙන් නිපදවීමට හැකි වනවා පමණක් නොව, පිටරට පැටවීමට ද හැකි

වෙතැයි ගණන් බලා ඇත. අලුත් යන්ත්‍රෝපකරණ සම්පූර්ණයෙන් සවි කිරීමෙන් පසු වසරකට සපත්තු කුට්ටම් දසලක්ෂයක් හෙවත් 1962 මුළු නිෂ්පාදනය මෙන් දස ගුණයක් නිෂ්පාදනය කිරීමට හැකි වෙතැයි ගණන් බලා ඇත.

## හම් නිෂ්පාදිත සමායතනය (අ)

| වර්ෂය | අනුදත් ප්‍රාග්ධනය (රු. දශලක්ෂ) | (ස්ථාවර ප්‍රාග්ධනය රු. දශ ලක්ෂ) | | | නිපැයුම (ඇ) | | | රැකියා |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | හම් නිෂ්පාදිත | | නැවතත් (ඉ) (ජෝඩු දහසින්) | |
| | | යන්ත්‍රෝපකරණ | ඉඩම් සහ ගොඩනැගිලි | අනෙකුත් ඇතුළු එකතුව | ක්‍රෝම් වර්ග (අඩි දහස්) | අනෙකුත් (ඈ) (රාත්තල්) දහසින් | | |
| 1956 (ආ) .. .. | 1·7 | 0·45 | 0·38 | 0·83 | 74·9 | 156·1 | 11·8 | 221 |
| 1957 .. .. | 1·7 | 0·32 | 0·51 | 0·83 | 128·1 | 231·0 | 30·4 | 251 |
| 1958 .. .. | 1·7 | 0·39 | 0·50 | 0·89 | 193·6 | 224·3 | 42·1 | 288 |
| 1959 .. .. | 1·7 | 0·39 | 0·50 | 0·87 | 306·3 | 223·8 | 51·8 | 295 |
| 1960 .. .. | 1·7 | 0·38 | 0·47 | 0·97 | 335·1 | 203·8 | 55·6 | 298 |
| 1961 .. .. | 1·7 | 0·40 | 0·47 | 1·57 | 396·7 | 206·7 | 52·2 | 300 |
| 1962 .. .. | 5·2 | 2·00 | 2·23 | 5·20 | 511·0 | 199·0 | 101·0 | 345 |

(අ) මුදල් පිළිබඳ සංඛ්‍යා තොරතුරු අප්‍රේල්-මාර්තු-ගිණුම් වර්ෂ අනුවයි. නිෂ්පාදනය සහ රැකියා පිළිබඳ සංඛ්‍යා තොරතුරු ලිත් වර්ෂ අනුවයි.
(ආ) අප්‍රේල්-දෙසැම්බර් මාස 9 ට
(ඇ) හම් භාණ්ඩ අංශයේ නිෂ්පාදිත හැර
(ඈ) එල හරක් හම්, මීහරක් හම් සහ එලු හම් ආදිය ඇතුළත් වෙයි.
(ඉ) දිග සපත්තු, සපත්තු සහ ළමා සපත්තු

### ඛනිජ වැලි සමායතනය

සමායතනයේ 'ඉල්මනයිට්' නිෂ්පාදනය සීමා සහිතව කැරුණේ 1962 දී ටොන් 11,500 ක් නිපදවිණි. මෙයින් සුළු කොටසක් ප්‍රධාන වශයෙන්ම වෙළෙඳ සැම්පල් වශයෙන් පිටරට යැවිණි. නිෂ්පාදනය සීමා කිරීමට එක් හේතුවක් වූයේ, සමායතනය ගොඩනැගිලි වැඩවල නියුතු වීමය. අනෙක් හේතුව වූයේ 'ඉල්මනයිට්' වලට පිටරට සැළකිය යුතු වෙළෙඳ පොළක් මෙතෙක් හමු නොවීමය. අවුරුද්දේ පිටරට පැටවූ සුළු ඉල්මනයිට් ප්‍රමාණය ජපානයට යවන ලදී. වැඩි තොග යක් යැවීම සඳහා දැනට ලිපි ගනුදෙනු වෙමින් පවතී. සෑහෙන වෙළෙඳ පොළක් ඇති වී නම් තිබෙන යන්ත්‍රෝපකරණ වලින්, දැනට මෙන් එක වඩියක් නොව වඩි තුනක් වැඩ කිරීමෙන් නිෂ්පාදනය සෑහෙන ලෙස වැඩි කිරීමට සමායතනයට හැකි වෙයි.

1962 දී ස්ථාවර වත්කම් රුපියල් දස ලක්ෂයකින් පමණ වැඩි වූයේ, ප්‍රධාන වශයෙන් ම නාවික බෝට්ටු මිලට ගැනීමත්, නිෂ්පාදිත භාණ්ඩ පිටරට පැටවීමේ ස්ථානයට ගෙනඒම සඳහා ජෙටියක් සහ පුවරු පාලමක් ගොඩනැගීමත් නිසාය.

## ඛනිජ වැලි සමායතනය

| වර්ෂය (අ) | අනුදත් ප්‍රාග්ධනය (රු. දශ ලක්ෂ) | ස්ථාවර ප්‍රාග්ධනය (රු. දශ ලක්ෂ) | | | රැකියා | ඉල්මනයිට් නිපැයුම (ටොන්) | ලාභ (රු. දශ ලක්ෂ) |
|---|---|---|---|---|---|---|---|
| | | යන්ත්‍රෝප කරණ | ඉඩම් සහ ගොඩ නැගිලි | එකතුව | | | |
| 1959 .. .. .. | 8·0 | 1·1(ආ) | 0·3 | 1·4 | ල.නො. | — | ල. නො. |
| 1960 .. .. .. | 8·0 | 1·6 | 2·1 | 3·7 | 90 | — | ල. නො. |
| 1961 .. .. .. | 8·0 | 2·0 | 2·0 | 6·1 | 100 | — | ල. නො. |
| 1962 .. .. .. | 8·0 | 2·0 | 2·0 | 7·3 | 100 | 11,500 | ල. නො. |

(අ) මුදල් වර්ෂය අප්‍රේල්-මාර්තු
(ආ) යන්ත්‍ර සැපැයීමට සහ සවි කිරීමට ගෙවූ අත්තිකාරම් ඇතුළත් වෙයි.

**ජාතික කුඩා කර්මාන්ත සමායතනය**

ජාතික කුඩා කර්මාන්ත සමායතනය විසින්, වඩු කම්හල් 11 ක් ද යාන්ත්‍රික බෝට්ටු තනන වැඩපළක් ද, උළු කම්හල් 5 ක් ද, ආයුර්වේද ඖෂධ නිපදවන කම්හලක් ද, යන විසින් කුඩා කර්මාන්ත පෙළක්ම සැලසුම් කොට ඇත.

වඩු කම්හල් සඳහා අනුදත් ප්‍රාග්ධනය රුපියල් දශලක්ෂයකි. (මේ කම්හල් ඇරැඹුනේ 1954–58 පැවැති වඩු සමිති වෙනුවටය) මේ මුදල සම්පූර්ණයෙන්ම වැඩට ගෙන ඇති අතර, තවත් රුපියල් 8,50,000 මේ සඳහා වෙන් කොට තිබේ. වඩු කම්හල් වලින් ප්‍රධාන වශයෙන්ම රජයේ දෙපාර්තමේන්තු වලට භාණ්ඩ සාදනු ලබයි. දැනට 200 ක පමණ ලිපිකරු හා පරිපාලක මණ්ඩලය හැර මෙහි කම්කරුවෝ 1000 ක් පමණ වැඩ කරති.

සමායතනයේ වඩුවැඩ අංශය ආරම්භයේ සිටම, මෙතෙක් වසරකට සාමාන්‍යයෙන් රුපියල් 8,000ක පමණ පාඩුවක් විඳිමින් එයි. මෙසේ පාඩු ඇතිවීමට හේතු වූ කරුණු අතර, හොඳ දැව දඬු ප්‍රමාණවත්ව නොලැබීම, සමායතනයෙන් නිෂ්පාදනය කැරෙන භාණ්ඩ සඳහා රජයේ රෙගුලාසි අනුව සීමිත මිලක් අය කිරීම, පෞද්ගලික අංශයේ සහ, සැකසූ අංශයේ වඩු කර්මාන්තය පුළුල්වී යාම නිසා, පෞද්ගලික ඉල්ලීම් ලබා ගැනීමට දුෂ්කරවීම, පෞද්ගලික අංශයේ කුඩා වඩුවින්කල් විශාල ගණනක් අරඹා ඇති අතර, සැකැසූ අංශයේ සමුපාකාර වඩු සමිති 2,000 ක් පමණ ද ගල් ඔය සංවර්ධන මණ්ඩලය මගින් යන්ත්‍රානුසාරයෙන් වැඩ කරන වඩු කම්හලක් ලඟදී අරඹා තිබීම ද, ප්‍රධාන වෙයි.

කම්කරුවන් උනන්දු කිරීමේ වැඩ පිළිවෙළක් අනුව හා භාණ්ඩ නිෂ්පාදනය වැඩි කිරීමෙන්, සමායතනයේ තරඟයට මුහුණ පෑමට ඇති ශක්තිය දියුණු කිරීමට උත්සාහ ගෙන තිබේ. සමායතනය ලී ඉරන මෝලක් ද, සවිකරගෙන යන අතර මින්පසු සමායතනයට ලී ඉරීම සඳහා පෞද්ගලික කොන්ත්‍රාත් කරුවන්ගේ සහාය සෙවීමට ඇවැසි නොවන්නේය. ආයෝජනය කිරීමට බලාපොරොත්තු වන රුපියල් 8,50,000 මේ ඉරන මෝල සවිකිරීමට සහ සමහර නිෂ්පාදන අංශවල නිපැයුම් වියදම කපා හැරීම සඳහා, ඒ අංශ යන්ත්‍රානුසාරයෙන්, වැඩ කිරීමට පිළියෙළ කිරීමට ද යොදනු ලැබේ.

සමායතනය පටන් ගැනීමට බලාපොරොත්තු වන උළු කම්හල් පහේ නිෂ්පාදනය ඇරැඹුන විට, වසරකට උළු ලක්ෂ තිහක් පමණ නිපදවිය හැකි යයි ගණන් බලා ඇත. පළමු උළු කම්හල 1963 අප්‍රේල් මාසයේදී නිෂ්පාදන කටයුතු ඇරැඹීමට නියමිතය.

බෝට්ටු සාදන වැඩපළේ කටයුතු වලින් සමායතනය ලාභ උපයයි.

**ඊස්ටන් පේපර් මිල්ස් සමායතනය**

1962 සමායතනයේ කඩදසි නිෂ්පාදනය ටොන් 4,700 වීමෙන් 1959 සිටම සමායතනයේ කඩදසි නිෂ්පාදනය එකම මට්ටමෙහි පැවැති බවක් පෙනේ. මෙය මෙරටට අවශ්‍යයැයි ඇස්ත මේන්තු කොට ඇති කඩදසි ප්‍රමාණයෙන් සියයට 42 ක් පමණෙකි. සමායතනයේ වාර්ෂික පාඩුව තවදුරටත් පැවැතිණි. 1959 සිටම මේ පාඩුව වසරකට රුපියල් පහලොස් ලක්ෂයක් පමණ විය. 1958 අවසානයේදී පමණ, පරිපාලන හා ශිල්පී වශයෙන්, ප්‍රතිසංස්කරණයක් ඇති කැරුනේ 1962 දී එහි ස්ථාවර වත්කම් ද වැඩි කැරිණි. පාඩු ඇතිවීමට හේතු වූයේ, කඩදසි මිලට ගැනීමේදී රජය ගෙවනු ලබන අඩු මිලත් (නිපැයුම් වැයට ද අඩු) නොවිකුණා ඇති කඩදසි තොගත් නිසාය. මැතම ගිණුම් වර්ෂය අවසානවන විට, මෙසේ නොවිකුණා තිබුණු කඩදසි තොගයේ වටිනාකම රුපියල් හැත්තැලක්ෂයක් විය. මෙය සමායතනයේ අවුරුද්දක නිෂ්පාදනයට සමානය. කඩදසි නිෂ්පාදන වියදම ද ක්‍රමයෙන් අඩු වී ඇත. 1959 දී කඩදසි ටොන් එකක් නිපද වීම සඳහා රුපියල් 2,039 ක් වැය වූ අතර (කොළඹ ගබඩාවෙන්) 1962 වන විට එය රුපියල් 1,600 තෙක් අඩුවිය. 1961–62 රජය විසින් මිලයට ගත් කඩදසි, වෙළෙඳ පොළේ පවත්නා මිල අනුව, අගය කොට, නිපදවා ගබඩා කොට තිබෙන කඩදසි වල වටිනාකමත් ගණන් ගතහොත් රුපියල් දහතුන් ලක්ෂ විසිදහක් පමණ වූ සමායතනයේ අලාභය, රුපියල් 2,77,000 ක ලාභයක් බවට පෙරලෙතැයි ඇස්තමේන්තු කොට ඇත.

පසුගිය වර්ෂයේ සමායතනය මගින් යෙදවූ අමතර මුදල් නිසා ශිල්පීමය කාර්යක්ෂමතාවය දියුණු වෙතැයි බලාපොරොත්තු වන අතර, නිෂ්පාදනය වන කඩදසි වර්ග වැඩි කිරීමට ද, බලාපොරොත්තු වෙයි. මීට පෙර, පිදුරු එකතුකොට, ගෙන ඒමේදී මුහුණ පෑමට සිදුවූ දුෂ්කරතාවන් නිසා, පිදුරු යන්ත්‍රානුසාරයෙන් මිටි කොට කුඹුරේ සිට කම්හලට ගෙන ඒමට කටයුතු යොදා ඇත. (සමායතනයේ අමු ද්‍රව්‍ය වලින් සෑහෙන ප්‍රමාණයක් පිදුරු සහ ඉලුක් වලින් සමන්විත වෙයි). පිදුරු ගෙන ඒමේදී හා පරිහරණයේ දී මුහුණ පෑමට සිදුවූ ප්‍රශ්න නිරාකරණය කිරීමෙන් කම්හලේ වැඩට නොකඩවාම පිදුරු ලබා ගැනීමට හැකි වී තිබේ. දිවයිනට දැනට අවශ්‍ය පමණට කොපි පොත් නිපදවීම සඳහා ද යන්ත්‍ර සවි කොට තිබේ. එහෙත්, පෞද්ගලික, නිෂ්පාදකයන්ගේ වෙළෙඳ පොළට හානි නොවනසේ, සමායතනය, කොපි පොත් නිපැයීම සීමාකොට ඇත. සමායතනයේ කඩදසි වලින් කොපි පොත් සාදන්නේ නම්, ඒ සඳහා පෞද්ගලික නිෂ්පාදකයනට විශේෂ මිලකට කඩදසි ද සැපයෙයි. සමායතනය එහි කොපි පොත් සඳහා පිටරට වෙළෙඳ පොළවල් සොයමින් සිටී. දැනටමත් බුරුමයෙන් හා අප්‍රිකාවෙන් මේ ගැන විමසුම් කොට ඇත.

අලවා සාදන සිමෙන්ති බෑග්, නිතර නිතර කඩා වැටීම නිසා උද්ගත වූ ප්‍රශ්නය මඟ හරවා ගැනීම සඳහා බෑග් මැසීමට යන්ත්‍රයක් සවිකොට ඇත. සිමෙන්ති බෑග් විකිණීම වැඩිවී ඇති අතර, පුනක්කු සහ කුකුල් කෑම අහුරා ගෙනයාමට ද බෑග සැපයීමට සමායතනයට හැකියාවක් උදවී තිබේ. පසුගිය අවුරුද්දේ සාර්ථක අන්දමින් කැරුන සංස්කරණයන් අතර කඩදසි සෑදීමට කාර්යක්ෂම ලෙස ද්‍රව්‍ය මොලොක් කිරීමේ ක්‍රමයක් ද ඇතුළත් වෙයි. දැනට තිබෙන මොලොක් කරන හා කඩදසි තනන මෝලට කාඩ් බෝඩ් තනන මෝලක් ද, එකතු කිරීමට හැකි ද යන්න ගැන සමායතනයේ අවධානය යොමු වී ඇත.

## ඊස්ටන් පේපර් මිල්ස් සමායතනය (අ)

| වර්ෂය | අනුදත් ප්‍රාග්ධනය (රු. දශ ලක්ෂ) | ස්ථාවර වත්කම් (රු. දශ ලක්ෂ) | | | කඩදසි නිපැයුම (ටොන් දහසින්) | රැකියා |
|---|---|---|---|---|---|---|
| | | යන්ත්‍රෝපකරණ | ඉඩම් හා ගොඩනැගිලි | අනෙකුත් දෑ ඇතුළුව එකතුව | | |
| 1956 .. .. | 22·0 | 9·2 | 8·2 | 18·5 | 0·36 | ල. නො. |
| 1957 .. .. | 22·0 | 8·5 | 8·1 | 18·0 | 1·42 | ල. නො. |
| 1958 .. .. | 22·0 | 8·2 | 8·0 | 17·2 | 1·25 | 404 |
| 1959 .. .. | 22·0 | 7·8 | 7·9 | 16·5 | 4·19 | 472 |
| 1960 .. .. | 22·0 | 7·7 | 8·1 | 15·9 | 4·56 | 522 |
| 1961 .. .. | 26·1 | 7·3 | [8·2 | 15·6 | 4·53 | 567 |
| 1962 .. .. | 29·0 | ල. නො. | ල. නො. | ල. නො. | 4·69 | 614 |

(අ) මුදල් පිළිබඳ සංඛ්‍යා තොරතුරු අප්‍රේල්-මාර්තු ගිණුම් වර්ෂ අනුව නිෂ්පාදනය හා රැකියා සංඛ්‍යා තොරතුරු ලිත් වර්ෂ අනුව.

### පිඟන් සමායතනය

පසුගිය තෙවස තුළ දී වසකට සාමාන්‍ය වශයෙන් ටොන් 445 ක් පමණ වූ පිඟන් භාණ්ඩ නිෂ්පාදනය, 1962 දී ටොන් 687 තෙක් වැඩි විය. මේ දියුණුවට හේතු වූයේ 1961 දී සමායතනය පටන් ගත් නිෂ්පාදන කටයුතු පුළුල් කිරීමේ වැඩ පිළිවෙළයි. මේ අනුව 1962 දී සමායතනයේ ස්ථාවර වත්කම්වලට රුපියල් කෝටි 0.27 ක වත්කම් එකතු කරනු ලැබීය. මේ අවුරුද්දේ දී ටොන් 840 ක් ඉසිලිය හැකි අලුත් පෝරනු දෙකක් ද අරඹන ලදී.

පිඟන් සමායතනය පුළුල් කිරීමේ වැඩ පිළිවෙළට, පිඟන් මැටි පිරිසිදු කරන යන්ත්‍රයක් ද ඇතුළත් විය. මෙය දැනට සවි කොට ඇති අතර, 1963 දී නිෂ්පාදන කටයුතු ඇරැඹීමට බලාපොරොත්තු වෙයි. මේ යන්ත්‍රය නිසා සමායතනය පාවිච්චියට ගනු ලබන අමු ද්‍රව්‍ය වලින් තුනෙන් එකක් පමණ වන පිඟන් මැටි, සෑහෙන පමණට නොකඩවාම ලබා ගැනීමට හැකි වෙයි. මෙතෙක් මේ මැටි සම්පූර්ණයෙන්ම පිටරටින් ගෙන්වා ගනු ලැබීය. මේ යන්ත්‍රයෙන් නිපදවීමට ඇස්තමේන්තු කොට තිබෙන පිඟන් මැටි ප්‍රමාණය දැනට පිඟන් කර්මාන්ත ශාලාවේ අවශ්‍ය ප්‍රමාණ

යට වඩා වැඩි වෙයි. ඉතිරි මැටි සඳහා දෙවැනි කර්මාන්ත ශාලාවක් ඇරඹීමට පදනම් කොට ඇත. 1964 නිෂ්පාදන කටයුතු ඇරඹීමට නියමිතව ඇති මේ කර්මාන්ත ශාලාවෙන් පිඟන් බඩු ටොන් 1,600 ක් ද, බිතු සායම් ටොන් 300 ක් ද සෞඛ්‍යාරක්ෂක භාණ්ඩ ටොන් 5,000 නිපදවීමට බලාපොරොත්තු වෙයි.

## පිඟන් සමායතනය (අ)

| වර්ෂය | අනුදත් ප්‍රාග්ධනය (රු. දශ ලක්ෂ) | ස්ථාවර වත්කම් (රු. දශ ලක්ෂ) | | | පිඟන් බඩු නිපැයුම ටොන් | රැකියා |
|---|---|---|---|---|---|---|
| | | යන්ත්‍රෝප කරණ | ඉඩම් හා ගොඩනැගිලි | අනෙකුත් දෑ ඇතුළුව එකතුව | | |
| 1957 (ආ) .. .. | 3·0 | 1·1 | 1·1 | 2·2 | 338 | 147 |
| 1958 (ඇ) .. .. | 5·2 | 1·0 | 1·1 | 2·1 | 290 | 139 |
| 1959 .. .. | 5·2 | 0·8 | 1·2 | 2·0 | 453 | 132 |
| 1960 .. .. | 5·2 | 0·8 | 1·2 | 2·0 | 466 | 186 |
| 1961 .. .. | 5·2 | 0·8 | 1·2 | 2·0 | 417 | 190 |
| 1962 .. .. | 5·2 | 3·5 | 1·2 | 4·7 | 687 | 235 |

(අ) 1959 සිට සංඛ්‍යා තොරතුරු මුදල් වර්ෂ අනුවය.
(ආ) ලිත් වර්ෂය
(ඇ) 1958 අගෝස්තු 1 සිට 1959 මාර්තු 31 තෙක් කාලච්ඡේදය.

### පරන්තන්හි රසායන සමායතනය

1962 දී කෝස්ටික් සෝඩා, සහ ක්ලෝරීන් නිෂ්පාදනය වැඩි වූයේ පිළිවෙළින් ටොන් 915 ක් සහ ටොන් 217 ක් නිපදවනු ලැබීය. (1961 දී නිපදවන ලද ප්‍රමාණය පිළිවෙළින් ටොන් 666 සහ 183 ක් විය) පසුගිය අවුරුදු කිහිපය තුළ සමායතනය වැඩට යෙදු වූ ස්ථාවර ප්‍රාග්ධනය නොවෙනස්ව තිබීමත්, මුළු කම්කරු සංඛ්‍යාව, 1962 මඳක් අඩුවීමත් නිසා වැඩි වූ නිෂ්පාදනය පැහැදිලිවම ඇති වූයේ යොදවා ඇති නිපැයුම් හැකියාව, වැඩියෙන් වැඩට ගැනීමෙනි. නිපදවන ක්ලෝරීන් ප්‍රමාණය දැනට දිවයිනේ ඇති අවශ්‍යතාවලට වඩා වැඩිය. (වැඩි කොටස අකර්මන්‍ය කරයි) කෝස්ටික් සෝඩා නිෂ්පාදනය වැඩිවීම පිටරටින් ගෙන්වීම අඩුකර ගැනීමට උදව් විය. සමායතනයේ කෝස්ටික් සෝඩා නිෂ්පාදනය අවශ්‍ය මුළු ප්‍රමාණයෙන් සියයට 40 ක් විය. 1961 දී නිපද වූයේ අවශ්‍ය ප්‍රමාණයෙන් සියයට 23 කි.

1963 දී සමායතනය, එහි කටයුතු වැඩි දුරටත් කාර්යක්ෂමව කිරීමෙන් තවදුරටත් නිෂ්පාදන වියදම අඩු කර ගැනීමට බලාපොරොත්තු වෙයි. එසේම දැනට පවත්නා නිපැයුම් හැකියාව පුළුල් කිරීම සඳහා අමතර, රුපියල් 8,00,000 ප්‍රාග්ධනයක් යොදවනු ඇත. මේ මුදලෙන්, සෙන්ට්‍රිෆියුගල් පොම්පයක් සහ සම්පීඩක පරිවර්තකයක් සවි කිරීමට බලාපොරොත්තු වෙයි. මෙයින් කර්මාන්ත ශාලාවේ දෙදරීම් ආදිය අඩු වෙතැයි සැලකේ. එසේම කැරෙකෙන උඳුනක් සවි කිරීමෙන් වේලෙන ලුණු විකිණීමට හැකි වෙයි.

## පරන්තන්හි රසායන සමායතනය

| වර්ෂය | අනුදත් ප්‍රාග්ධනය (රු. දශ ලක්ෂ) | ස්ථාවර ප්‍රාග්ධනය (රු. දශ ලක්ෂ) | | | රැකියා | නිපැයුම | |
|---|---|---|---|---|---|---|---|
| | | යන්ත්‍රෝප කරණ | ඉඩම් හා ගොඩ නැගිලි | අනෙකුත් දෑ ඇතුළුව එකතුව | | කෝස්ටික් සෝඩා (ටොන්) | ක්ලෝරීන් (ටොන්) |
| 1956 .. .. | 15·7 | 8·3 | 2·6 | 11·5 | ල.නො. | — | — |
| 1957 .. .. | 15·7 | 5·8 | 3·2 | 9·5 | ල.නො. | — | — |
| 1958 .. .. | 15·7 | 6·0 | 3·4 | 10·0 | 174 | 25 | 2 |
| 1959 .. .. | 15·7 | 6·0 | 3·4 | 10·1 | ල.නො. | — | — |
| 1960 .. .. | 15·7 | 6·3 | 3·5 | 10·5 | 223 | 64 | 70 |
| 1961 .. .. | 15·7 | 6·3 | 3·5 | 10·5 | 222 | 666 | 183 |
| 1962 .. .. | 15·7 | 6·3 | 3·5 | 10·5 | 210 | 915 | 217 |

## ලංකා සිමෙන්ති සමායතනය

ලංකාවේ සිමෙන්ති කර්මාන්තය පුළුල් කිරීමේ වැඩ පිළිවෙළේ අවස්ථාවන් සංශොධනය කොට ඇත. මෙයට එක් අතකින් හේතු වූයේ ලංකාවේ සිමෙන්ති භාවිතය මුලදී සිතූ පමණට වඩා අඩු වෙතැයි දක්නා ලැබීමය. දැනට නිෂ්පාදනය වන ප්‍රමාණය ටොන් 85,000 ක් වෙයි. මෙය 1966 වන විට ටොන් 4,50,000 තෙක් වැඩි කිරීමට ඇස්තමේන්තු කොට ඇත. මේ ඉලක්කය කරා පැමිණීම සඳහා කංකසන්තුරේ සිමෙන්ති නිෂ්පාදන වැඩ පුළුල් විය යුතු අතර, ගාල්ලේ සිමෙන්ති ගල් ඇඹරුම් මෝලක් ද, පුත්තලමේ දෙවැනි සිමෙන්ති කම්හලක් ද, ඇරැඹිය යුත්තේය. තව ද, සිමෙන්ති නිෂ්පාදිත කිහිපයක්ම නිපදවීමට බලාපොරොත්තු වෙයි. මේවාට ටැලිපෝන් පෙට්ටි, ටැලිග්‍රාප් කනු හා වලලන සන්දම පයිප්ප ඇතුළත් වෙයි.

කන්කසන්තුරේ සිට සිමෙන්ති ගල් ගෙනැවිත්, සිමෙන්ති ගල් ඇඹරුම් මෝලේ කටයුතු කිරීමෙන් නිෂ්පාදනය වන සිමෙන්ති වල, ප්‍රවාහන වියදම අඩු වන්නේ ය. ටොන් 2,00,000 ක නිපැයුම් හැකියාවක් ඇතිව, පුත්තලමේ ඉදි කිරීමට යන දෙවැනි සිමෙන්ති කම්හල සිමෙන්ති නිෂ්පාදනය පුළුල් කිරීමේ වැඩ පිළිවෙළේ ප්‍රධාන කොටසක් වන අතර, ඇස්තමේන්තු කර ඇති මුළු ආයෝජනයෙන් සැහෙන ප්‍රමාණයක් මෙයට යෙදවෙයි. අලුත් කර්මාන්ත ශාලාව ඉදි කරන ස්ථානය, දැනට ශුද්ධ කොට ඇත. දැනට කංකසන්තුරේ ඇති කර්මාන්ත ශාලාව පුළුල් කිරීමේ ගොඩනැගිලි වැඩද, අරඹා ඇත. ගාල්ලේ සිමෙන්ති ගල් අඹරන මෝලේ වැඩ 1964 ප්‍රථම කාර්තුවේ දී අවසන් කිරීමට නියමිතය.

කර්මාන්තශාලා තුන පටන් ගැනීමත් සමග, බලාපොරොත්තු වන අයුරු ආයෝජනයන්ගේ නිෂ්පාදනයන් වැඩි වීමත් සිමෙන්ති සහ සිමෙන්ති නිෂ්පාදිත බෙද හැරීමට අලුත් සංවිධානයක් ඇරැඹීමත් සමග දැනට තිබෙන පරිපාලන හා ක්‍රියා කාරී මණ්ඩලය පිට අලුත් බර පැටවීමට ඉඩ තිබේ. එමනිසා සමායතනයේ සහ පරිපාලන විධිවිධාන ගිණුම් සහ සංවිධානය සම්බන්ධයෙන් ලඟදී කැරුන සමාලෝචනයකට අනුව සමායතනයේ ප්‍රතිසංස්කරණයක් ඇති කිරීමට අදහස් කොට තිබේ.

### ලංකා සිමෙන්ති සමායතනය

| වර්ෂය (අ) | අනුදත් ප්‍රාග්ධනය (රු. දශ ලක්ෂ) | ස්ථාවර ප්‍රාග්ධනය (රු. දශ ලක්ෂ) (ආ) | | | රැකියා | නිපැයුම සිමෙන්ති (ටොන්) |
|---|---|---|---|---|---|---|
| | | යන්ත්‍රෝප කරණ | ඉඩම් හා ගොඩනැගිලි | අනෙකුත් දෑ ඇතුළු එකතුව | | |
| 1956 .. .. | 26·8 | 7·01 | 7·39 | 14·62 | ල.නො. | 83·4 |
| 1957 .. .. | 26·8 | 6·02 | 6·16 | 12·40 | ල.නො. | 48·2 |
| 1958 .. .. | 26·8 | 5·40 | 6·52 | 12·11 | ල.නො. | 79·1 |
| 1959 .. .. (ජනවාරි–මාර්තු) | 26·8 | 5·21 | 6·64 | 12·03 | ල.නො. | 23·0 |
| 1959/60 .. .. | 64·8 | 5·25 | 5·98 | 11·48 | ල.නො. | 91·9 |
| 1960/61 .. .. | 64·8 | 4·68 | 5·27 | 10·27 | 972 | 80·5 |
| 1961/62 .. .. | 64·8 | 2·93 | 4·72 | 8·13 | 987 | 85·7 |

(අ) 1956, 1957, 1958 ලිත් වර්ෂ; 1959–60 සිට අප්‍රේල්–මාර්තු මුදල් වර්ෂ
(ආ) ඒ ඒ ගිණුම් වර්ෂ අවසානයට ක්ෂයවීම් අඩුකොට.

## කන්තලේ සීනි සමායතනය

කන්තලේ සීනි කර්මාන්ත ශාලාවේ 1962 දී සීනි ටොන් 1,044 පමණ නිපදවා ඇත. මෙය 1962 ලංකාවට අවශ්‍ය වූ සීනි ප්‍රමාණයෙන් සියයට එකකින් බාගයක් පමණ වෙයි. (ගල්ඔය සංවර්ධන මණ්ඩලයෙන් 1961–62 නිපදවන ලද සීනි ප්‍රමාණය ටොන් 2,541 කි) 1962 සමායතනයේ සීනි නිෂ්පාදනය පසුගිය දෙවර්ෂයේදීට වඩා දියුණු වුවද, තවමත් නිපැයුම් හැකියාවට අඩුවෙන් නිපදවන බව පෙනේ. කර්මාන්ත ශාලාවේ නිපැයුම් හැකියාව ටොන් 14,000 වෙයි. සීනි කම්හලේ නිපැයුම් කටයුතු වලට මුහුණ පෑමට සිදුවී ඇති මූලික අවහිරය වී ඇත්තේ සැහෙන පමණට උක්ගස් නොමැති වීමයි. මේ නිසා අලාභ සහගත සේ නිෂ්පාදන වියදම වැඩි වී ඇත. මෙයට හේතු වී ඇත්තේ උක් කැපීම ආදිය කරන අස්වනු සමයේ දී, ඇතිවන කම්කරු ප්‍රශ්න සහ සමහර ස්වාභාවික අනතුරු නිසාය. කම්කරු ප්‍රශ්නය මතු වන්නේ මේ කාලය බොහෝ

විටම ලංකාවේ වී අස්වැන්න කාලය වන නිසා කම්කරුවන් ලබා ගැනීමට අපහසු වීමයි. ස්වාභාවික අනතුරු වී ඇත්තේ ජල පහසුකම් මදි වීමත්, තිබෙන උක් වගාව අලින්ට ගොදුරු වීමේ තර්ජනයත් ය. පළමු ප්‍රශ්නය නිරාකරණය කර ගැනීම සඳහා යටත් පිරිසෙයින් අඩ වශයෙන් වත් උක් කැපීම යන්ත්‍රානුසාරයෙන් කිරීමේ අවශ්‍යතාව සමායතනය පිළිගෙන ඇත. කම්කරු දුලබ තාවය නිසා උක් වගා කැරෙන බිම් ප්‍රමාණය දැඩි ලෙස සීමා කිරීමට සිදුවීම පමණක් නොව උක් වගාව පිළිබඳ සමහර කෘෂි අවශ්‍යතා සෑහෙන පමණට නොපිරි මැසීම නිසා දිගටම අස්වැන්න අඩුවීමට හේතු වී ඇත. උක් ගස් වලින් ලබා ගත් සීනිවල, අනුපාතය මුල දී සියයට 4 ක් වුවද, 1961 සියයට 8·6 තෙක් වැඩිවිය. කන්තලේ කරන ලද පිරික්සීමක් අනුව මෙය සියයට 10 තෙක් වැඩි කළ හැකි බව පෙනී ගොස් ඇත.

උක් පැනියේ අතුරු නිෂ්පාදන ප්‍රයෝජනයට ගෙන මද්‍ය සාරය පෙරීම සඳහා ඉදි කැරීගෙන යන කර්මාන්ත ශාලාව, දැනට වැඩ නිමාවට යන තැනට පැමිණ ඇත. මද්‍ය සාරය පෙරන ස්කාගාරයේ නිෂ්පාදන කටයුතු ඇරැඹීමක් සමග සමායතනයේ මුළු නිෂ්පාදන වියදම සෑහෙන ප්‍රමාණයකින් අඩු වෙතැයි බලාපොරොත්තු වේ. මේ අංශ දෙක නිෂ්පාදනය ඇරැඹීමෙන් පසු කම්කරු නිවාස සඳහා අමතර වශයෙන් මුදල් යෙදවීමට බලාපොරොත්තු වෙයි.

## කන්තලේ සීනි සමායතනය

| වර්ෂය (අ) | රජයෙන් දුන් ප්‍රාග්ධනය (රු. දශ ලක්ෂ) | ස්ථාවර ප්‍රාග්ධනය (රුපියල් දශ ලක්ෂ) | | | රැකියා | සීනි නිපැයුම (ටොන්) |
|---|---|---|---|---|---|---|
| | | යන්ත්‍රෝප කරණ | ඉඩම් හා ගොඩනැගිලි | අනෙකුත් ද ඇතුළු එකතුව | | |
| 1958 .. .. | 10·0 | — | 0·04 | 0·06 | ල.නො. | — |
| 1959 .. .. | 14·7 | 6·1 | 0·80 | 7·4 | ල.නො. | — |
| 1960 .. .. | 18·5 | 11·7 | 1·85 | 14·9 | ල.නො. | 274 |
| 1961 .. .. | 23·3 | 12·7 | 7·40 | 21·9 | 360 | 307 |
| 1962 .. .. | 28·9 | ල.නො. | ල.නො. | ල.නො. | — | 1,044 |

(අ) අන්තිම කොටුව හැර අනෙකුත් සංඛ්‍යා මුදල් වර්ෂ අනුවයි. (අප්‍රේල්-මාර්තු) සීනි නිපැයුම් සංඛ්‍යා ලිත් වර්ෂ අනුවයි.

### තුනී ලෑලි සමායතනය

සමායතනය ආරම්භයේ සිටම තුනී ලෑලි සහ තුනී ලෑලි භාණ්ඩ (තේ පෙට්ටි) නිෂ්පාදනය කෙමෙන් වැඩි වෙමින් පවතී. එහෙත් 1958 නිෂ්පාදනය මඳක් අඩු විය. 1962 දී තුනී ලෑලි සහ තුනී ලෑලි භාණ්ඩ (තේ පෙට්ටි) නිෂ්පාදනය සෑහෙන ප්‍රමාණයකින් වැඩිවිය. මේ වසරේ දී තුනී ලෑලි වර්ග අඩි කෝටි 1·25 සහ තේ පෙට්ටි 7,02,400 ක් පමණ නිපද වූ අතර, 1961 දී නිපද වූ ප්‍රමාණය පිළිවෙළින් වර්ග අඩි කෝටි 0·98 ක් සහ තේ පෙට්ටි 4,58,100 ක් විය. 1961 දීට වඩා 1962 දී සමායතනයේ ස්ථාවර ප්‍රාග්ධනයෙහි ඇති වූ සුළු වැඩිවීමත් කම්කරු සංඛ්‍යාවෙහි වැඩි වෙනසෙක් නොවීමත් (සංඛ්‍යා ලබා ගැනීමට නොමැත) ගැන සලකා බලන විට 1962 දී තුනී ලෑලි නිෂ්පාදනයේ වැඩිවීමට ප්‍රධාන හේතුව වී ඇත්තේ තිබෙන නිපැයුම් හැකියාව වැඩි වැඩියෙන් ප්‍රයෝජනයට ගැනීම බව හෙළි වෙයි.

## තුනී ලෑලි සමායතනය

| වර්ෂය | අනුදත් ප්‍රාග්ධනය (රු. දශ ලක්ෂ) | ස්ථාවර ප්‍රාග්ධනය (රු. දශ ලක්ෂ) | | | රැකියා | නිපැයුම | | බදුවලට පෙර ලාභ (රු. දශ ලක්ෂ) |
|---|---|---|---|---|---|---|---|---|
| | | යන්ත්‍රෝප කරණ | ඉඩම් සහ ගොඩනැගිලි | එකතුව | | තුනී ලෑලි (ඇ) (වර්ග අඩි දශලක්ෂ) | තේ පෙට්ටි (අ) දහසින් | |
| 1956(ආ) | .. 2·8 | 0·7 | 0·8 | 1·5 | 351 | 5·6 | 367·2 | 0·4 |
| 1957 .. | .. 2·8 | 0·6 | 0·8 | 1·4 | 354 | 7·6 | 353·0 | 0·4 |
| 1958 .. | .. 2·8 | 0·6 | 0·7 | 1·3 | 356 | 6·9 | 330·7 | –0·5 |
| 1959 .. | .. 2·8 | 0·8 | 0·8 | 1·6 | 389 | 8·3 | 412·3 | 0·7 |
| 1960 .. | .. 2·8 | ල.නො. | ල.නො. | ල.නො. | ල.නො. | 9·3 | 434·3 | 0·4 |
| 1961 .. | .. 2·8 | 0·8 | 1·3 | 2·1 | ල.නො. | 9·8 | 458·1 | ල.නො. |
| 1962 .. | .. 2·8 | 1·4 | 1·3 | 2·7 | 594 | 12·5 | 702·4 | ල.නො. |

(අ) සම්පූර්ණ පෙට්ටි, උපකරණ හා පටි සමග, පෙට්ටි බාග (උපකරණ පටි නැතිව)
(ආ) 1956 අප්‍රේල් 1 වැනිදයින් ඇරඹෙන මාස 9
(ඇ) වෙළ තුනේ තුනී ලෑලි

### අළුත් කර්මාන්ත යෝජනා ක්‍රම

රාජ්‍ය අංශයේ අලුත් කර්මාන්ත යෝජනා ක්‍රම කිහිපයක්ම සඳහා සැලසුම් විවිධ අවස්ථා වන්හි නිමාවෙමින් පවතී. පොහොර කම්හලක්, ඛනිජ තෙල් පිරිසිදු කිරීමේ කම්හලක්, ගොවි කම් උපකරණ තැනීම සඳහා යකඩ කම්හලක්, පිටි මෝලක්, සිලිකා ගඩොල්, ජෙලටින් සහ මැලියම් නිපදවීම සඳහා කම්හලක් ද, සම්බන්ධයෙන් මූලික කාරක වාර්තා රජය විසින් පිළිගෙන තිබේ. ඛනිජ තෙල් පිරිසිදු කිරීමේ කම්හලට සහ පොහොර කම්හලට විශේෂයෙන් විදුලිය ඇතුළු අනෙක් දෑ එකවිට සැපයීමේ දී ශිල්පීමය අතින් ලැබිය හැකි ආර්ථික පිරිමැසීම නිසා මේ දෙක ඉදි කිරීමේ වැඩ පිළිවෙළ ඒකාබද්ධ කිරීමට අවශ්‍ය වී ඇත. ඛනිජ තෙල් පිරිසිදු කිරීමේ කම්හලේ සවිස්තර නියමයන් ලඟදීම නිමාවෙයි. යකඩ කම්හලේ ගොඩනැගිලි මේ වසරේ දී ඇරඹීමට නියමිතය. සිලිකා ගඩොල් සඳහා අවශ්‍ය හුණු ලබා ගැනීමට තිබේ ද යන්න ගැන පරීක්ෂා කර ගෙන යනු ලැබේ. මේ කම්හල ඒකල කර්මාන්ත වත්ත අසල පිහිටුවීමට බිමක් තාවකාලිකව තෝරා ගෙන ඇත.

### ලංකා ටයර් කර්මාන්ත ශාලාව

1962 ජනවාරි මාසයේ ඇරැඹූ ලංකා ටයර් කර්මාන්ත ශාලාව, 1965 අප්‍රේල් මාසයේ දී වෙළෙඳාම සඳහා නිෂ්පාදනය පටන් ගැනීමට නියමිතය. කර්මාන්ත ශාලාව ගොඩනැගීම සඳහා ඉන්ජිනේරු කටයුතු කරගෙන යනු ලැබේ. 1961–62 වසරින් ඇරඹෙන දෙවසර සඳහා රජයෙන් රුපියල් කෝටි 1·85 ක් සම්මත කොට තිබේ. මේ අවුරුදු දෙකේ මේ සඳහා විදේශීය භාණ්ඩ සඳහා යන වියදම රුපියල් කෝටි 0·875 ලංකාව හා එ.ස.සෝ.ස. සමග ගිවිස ගෙන ඇති ආර්ථික ශිල්පීමය සහයෝගතා ගිවිසුම යටතේ සැපැයෙන සෝවියට් ණය මාලාවෙන් සැපයීමට සලසා ඇත.

### ලංකා වානේ සමායතනය

වර්ෂයකට මෑඩි වානේ ටොන් 35,000 ක් සහ කම්බි නිෂ්පාදිත නිපදවීම සඳහා රුපියල් කෝටි 8 ක වියදමින් කම්හලක් ඇරැඹීමට සමායතනය යෝජනා කොට ඇත. කර්මාන්ත ශාලාව එ.ස.සෝ.ස. ගිවිසුමක් යටතේ අරඹනු ලැබේ. මෙය 1965 දී නිෂ්පාදනය ඇරැඹීමට බලාපොරොත්තුවන අතර, 400 කට පමණ රැකියා ලබා දීමට අදහස් කරයි.

## පෞද්ගලික අංශය

පෞද්ගලික අංශයේ, කාර්මික ව්‍යාපාර වල නිෂ්පාදන පිළිබඳ සම්පූර්ණ සංඛ්‍යා තොරතුරු නොමැති නිසා II (i)-1 සහ II (i)-3 වැනි සංඛ්‍යා සටහන්වල දී ඇති තොරතුරු වලින් දක්වෙන්නේ 1961–62 කාලය තුළ රජයෙන් අනුමත කළ අලුත් කාර්මික යෝජනා ක්‍රමවල යන්ත්‍ර, මිල, රැකියා සහ ප්‍රාග්ධන ආකෘතිය සම්බන්ධ තොරතුරු පමණෙකි. මේ තොරතුරු ලබා ගෙන ඇත්තේ ආයෝජකයන් වීමට බලාපොරොත්තු වන්නන් විසින් රජයට එවන ලද අයදුම්පත් වලිනි. අලුත් යෝජනා ක්‍රම ජාත්‍යන්තරව පිළිගත් කාර්මික වර්ග කිරීමෙහි සඳහන් ප්‍රධාන කාර්මික අංශ අනුව වර්ගකොට ඇත. මේවායේ වැඩි දියුණුවට දෙන ආධාර වලට, පිටරටින් ගෙන්වන ප්‍රාග්ධන උපකරණ, අමතර කොටස්, සහ අබලන් යන්ත්‍ර වෙනුවට යන්ත්‍ර අයත්වෙයි. තවද පළමු අවුරුදු පහ තුළ සහනදායක තීරුබද්දක් දීමද අයත් වෙයි. II (i)-1 වැනි සටහනින් දක්වෙන්නේ කර්මාන්ත අමාත්‍යාංශයේ, සංවර්ධන ශාඛාවෙන්, අනුමැතිය ලැබූ, ඇස්තමේන්තු ප්‍රාග්ධනය, ලක්ෂ දෙකක් හෝ ඊට වඩා විශාල හෝ, මධ්‍ය ප්‍රමාණයේ ව්‍යාපාරයි. II (i)-3 වැනි සටහනේ සඳහන් වන්නේ ග්‍රාමසංවර්ධන දෙපාර්තමේන්තුවෙන් සහ කුඩා කර්මාන්ත පිළිබඳ දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය දී ඇති ප්‍රාග්ධනය රුපියල් දෙලක්ෂයකට වඩා අඩු කුඩා ප්‍රමාණයේ කර්මාන්තයි.

අනුමත කළ කර්මාන්ත සඳහා ආධාර ක්‍රමය ඇරඹුනේ 1961 මැයි මාසයේදීය. මෙයින් පසු ගෙවී ගිය 18 මාසය තුළ කර්මාන්ත විශාල ගණනක්, මුළුමනින් 396 (අ) ක් අනුමත කරන ලදී. මෙයින් තුනෙන් එකක් පමණ විශාල හා මධ්‍ය ප්‍රමාණයේ කර්මාන්ත වූ අතර, මින් බාගයක් පමණ අනුමත කැරුනේ 1961 දෙවැනි භාගයේදීය. අනුමත කැරුණ මධ්‍ය ප්‍රමාණයේ සහ විශාල ප්‍රමාණයේ කර්මාන්ත ගණන හැම අඩ වසරකම වැටුනද, 1961 න් පසු අනුමත කරන ලද කර් මාන්ත ප්‍රමාණයන් වැඩිවිය. 1961 ජූලි—දෙසැම්බර් වලින් පටන් ගැනෙන අඩවස් තුනේදී අනුමත කැරුන කර්මාන්ත වලට, ගැනෙන ඇස්තමේන්තු කරන ලද ප්‍රාග්ධනය, පිළිවෙළින් රු. 5,49,000, රුපියල් 7,16,000 සහ රුපියල් 9,51,000ක් විය. සංඛ්‍යා ලැබී ඇති කෙටි කාලසීමාව පදනම් කොට බලන විට, මේ හැඩගැසීමෙන් පෞද්ගලික කර්මාන්ත හිමියා පළමුව ප්‍රාග්ධනය අඩුවෙන් අවශ්‍ය කර්මාන්ත පළමුව පටන්ගෙන, ලොකු කර්මාන්ත පසුවට තබන බව හැඟී යයි.

සටහන්වල සඳහන් කොට ඇති මධ්‍ය ප්‍රමාණයේ හා විශාල ප්‍රමාණයේ කර්මාන්තවල ඇස්තමේන්තු කළ මුලු ප්‍රාග්ධනය රුපියල් කෝටි 7·9 ක් වෙයි. මෙයින් සියයට 90 ක් පමණ ලාංකික ප්‍රාග්ධනය ලෙස සටහන් වී ඇත. මේ ගණයේ අනුමැතිය ලැබී ඇති කර් මාන්තවලින් අඩක් පමණ, අයත් වන්නේ අංශ හතරක කර්මාන්තවලටය. මේ හතර නම්, ලනු—කඹ, හා නූල් ඇතුළු රෙදිපිළි නිෂ්පාදනය, ලෝහ නිෂ්පාදිත, පොහොර ඇතුළු විවිධ රසා යනික නිෂ්පාදිත සහ විදුලි භාණ්ඩ සහ උපකරණයි. ආහාර පාන (අයි. එස්. අයි. සී. අංක. 201—03, 207—09 සහ 213) ගණයෙහි, අලුතෙන් ඇරඹූ මධ්‍ය ප්‍රමාණයේ හා විශාල ප්‍රමාණයේ කර්මාන්ත වල, ප්‍රාග්ධනය හා කම්කරු සංගුණකය අඩුය. මැටි සහ වීදුරු (අයි.එස්. අයි. සී. අංක 331—32 සහ 399 )ඇතුළු, ලෝහ නොවන නිෂ්පාදිත සඳහා ඇරඹූ කර්මාන්තවල, කර්මාන්තයකට වැටෙන ප්‍රාග්ධන සංගුණකය වැඩි වී ඇති අතර කම්කරු සංගුණකය කුඩාය. රැකීරක්ෂා කෙරෙහි විශාලම බලපෑමක් ඇතිවන්නේ ප්‍රාග්ධනය හා ශ්‍රමය සම්බන්ධ වැඩි සංගුණකයක් ඇති විශාල රෙදිපිළි කර්මාන්ත ගණයෙනි.

1961 මැයි මාසයෙන් පසු ගතවූ 18 මාසය තුළ කුඩා කර්මාන්ත 272 ක් අනුමත කැරිණි. II (i)·4 වැනි සටහනේ දක්වා ඇති පරිදි, මේ කර්මාන්ත වලින් පහෙන් තුනක් හෙවත්, 160 ක්ම කර්මාන්ත අංශ පහකට අයත්වෙයි. එනම්, රෙදිපිළි ඇඳුම්, (පාවහන් හැර ඇඟලන ඇඳුම්) පොහොර ඇතුළු රසායන නිෂ්පාදිත, ලෝහ නිෂ්පාදිත, ආහාර පාන සහ දුම්කොළයි. 1963ට පෙරාතුව අනුමත කරන ලද කුඩා කර්මාන්තවල ඇස්තමේන්තු කළ මුළු ප්‍රාග්ධනය රුපියල් කෝටි 1·8 ක් වෙයි. එක කර්මාන්තයක් අනුව බලන විට, එය රු. 7,000 ට හා විශාල කර්මාන්ත ගණයේ එක් කර්මාන්තයක ප්‍රාග්ධනය රු. 7,00,000 පමණ වෙයි. කුඩා කර්මාන්තවල එක කම්කරුවකුට ඇස්තමේන්තු කළ ප්‍රාග්ධන ප්‍රමාණය රුපියල් 2,700 ක් පමණ වෙයි. මධ්‍ය හා විශාල කර්මාන්ත වල මෙය රුපියල් 8,400 ක් පමණෙකි. මෙයින් කුඩා කර්මාන්තවල ශ්‍රමයෙන් හැකි පමණ වැඩ ගන්නා බව හෙළිවෙයි.

කුඩා කර්මාන්ත වලින් බාගයකටත් වඩා, (144ක්ම) අනුමත කැරුනේ 1962 ජනවාරි—ජූනි කාලය අතරය. ඊළඟ සමස තුළ අනුමත කැරුන ගණන වේගයෙන් අඩුවිය. 1963ට පෙරාතුව අනුමත කැරුන කුඩා කර්මාන්ත 272 න් යටත් පිරිසෙයින් 107 ක් පමණ දුන් වෙළෙඳාමට භාණ්ඩ නිෂ්පාදනය කරයි.(ආ)

---

(අ) මෙයින් නවයක් ම, එවිටමත් අරඹා තුබූ මධ්‍ය ප්‍රමාණයේ සහ, විශාල ප්‍රමාණයේ කර්මාන්ත විය. මේවා අලුත් නිෂ්පාදිත සඳහා අනුමත කරන ලදී. මේ කර්මාන්ත වල අනුමැතිය ලැබී ඇති, ප්‍රාග්ධන කොටස හා රැකියා පමණ ගලපා ගැනීමට ඇති අපහසුව නිසා මේවා 1 වැනි සටහනට ඇතුළත් කොට නැත.

(ආ) 1963 තැපැලෙන් කැරුණ පරීක්ෂණය පදනම් කොටය. අනුමත කර ඇති ඉතිරි කුඩා කර්මාන්ත පිළිබඳ තොරතුරු තවම ලැබී නැත. ප්‍රශ්න මාලාවට උත්තර සම්පූර්ණ නැත. නැතිනම් ලැබුනේ නැත.

සංඛ්‍යා සටහන II (1)—1

## 1961 මැයි—1962 දෙසැම්බර් කාලය තුළ අනුමත කැරුණු මධ්‍ය හා විශාල ප්‍රමාණයේ කර්මාන්තවල ඇස්තමේන්තු ප්‍රාග්ධනය හා රැකියා

| අයි.එස්. අයි.සී. අංකය | කාර්මික වර්ගය | යෝජනා ක්‍රම | ප්‍රාග්ධනය (රු.ද.ල.) | | රැකියා ගණන | යන්ත්‍රෝපකරණ වියදම් (රු.ද.ල.) |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| 201 සහ 203 | මස්, එලවළු සහ පළතුරු සකසා කල් තබා ගැනීම .. | 4 | 2·05 | — | 123 | 0·40 |
| 202 | කිරි නිෂ්පාදිත නිපදවීම—කිරි ආහාර .. .. | 1 | 0·26 | 0·25 | 39 | 0·21 |
| 207 සහ 208 | කොකෝවා, චොකලට්, පැණිරස කෑම සහ හකුරු නිෂ්පාදනය .. .. .. .. .. | 7 | 4·50 | — | 722 | 1·69 |
| 209 | විවිධ ආහාර වර්ග නිෂ්පාදනය .. .. .. | 1 | 0·40 | — | ල.නො. | 0·03 |
| 213 | බීම පෙරීම සහ රා සහ මෝල්ටඩ් නිෂ්පාදනය .. .. | 2 | 3·60 | — | 850 | 2·60 |
| 231–33 | ලනු, කඹ සහ නූල් ඇතුළු රෙදිපිළි නිෂ්පාදනය .. .. | 14 | 19·86 | 1·64 | 1,519 | 17·73 |
| 241 | පාවහන් නිෂ්පාදනය .. .. .. .. | 3 | 0·61 | — | 175 | 0·36 |
| 243 | පාවහන් හැර ඇඟ ලන ඇඳුම් .. .. .. | 3 | 1·33 | — | 154 | 0·29 |
| 271 | කඩදාසි, කඩදාසි බෝඩ් සහ පල්ප් මෝල් කඩදාසි බෝඩ් .. | 4 | 2·35 | — | 135 | 1·13 |
| 272 | කඩදාසි සහ පල්ප් භාණ්ඩ නිෂ්පාදනය .. .. | 2 | 0·40 | — | 32 | 0·25 |
| 300 | රබර් නිෂ්පාදිත නිෂ්පාදනය .. .. .. | 1 | 0·22 | — | 27 | 0·19 |
| 311 සහ 319 | විවිධ රසායනික නිෂ්පාදිත .. .. .. | 11 | 2·90 | 2·06 | 387 | 1·89 |
| 331–32 සහ 339 | මැටියෙන් හා වීදුරුවෙන් තැනූ භාණ්ඩ ඇතුළත් ලෝහ නොවන නිෂ්පාදිත .. .. .. | 3 | 6·45 | 0·60 | 720 | 6·12 |
| 341 සහ 350 | ලෝහ නිෂ්පාදිත .. .. .. .. | 22 | 8·09 | 0·84 | 1,289 | 4·45 |
| 360 | විදුලි යන්ත්‍රෝපකරණහැර යන්ත්‍රෝපකරණ නිෂ්පාදනය .. | 6 | 4·37 | 1·35 | 1,006 | 4·95 |
| 370 | විදුලි උපකරණ, මෙවලම් හා භාණ්ඩ නිෂ්පාදනය .. | 11 | 7·49 | 1·43 | 564 | 3·05 |
| 383 | කොටස් ගෙන්වා මෝටර් රථ සවිකිරීම .. .. | 1 | 0·15 | — | 5 | 0·15 |
| 393 සහ 399 | වෙනත් තැනක සඳහන් නැති නිෂ්පාදන කර්මාන්ත .. | 19 | 5·08 | 0·22 | 660 | 2·93 |
| | එකතුව | 115 | 70·11 | 8·39 | 8,407 | 48·42 |

සංඛ්‍යා—පිළිගත් කර්මාන්ත ලෙස අනුමැතිය සඳහා කර්මාන්ත අමාත්‍යාංශයට එවන අයැදුම්පත් වල තොරතුරු පදනම් කොට සැකසිණි.

සංඛ්‍යා සටහන II (i)—2

## 1961 මැයි — 1962 දෙසැම්බර් අනුමැති කාලය අනුව වර්ග කැරුණු මධ්‍ය ප්‍රමාණයේ හා විශාල ප්‍රමාණයේ කර්මාන්ත

| අයි. එස්. අයි. සී. අංකය | කාර්මික වර්ගය | 1961 | | | | 1962 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | මැයි — ජූනි | | ජූලි — දෙසැම්බර් | | ජනවාරි — ජූනි | | ජූලි — දෙසැම්බර් | |
| | | යෝජනා ක්‍රම | ප්‍රාග්ධනය (රුපියල් දශ ලක්ෂ) | යෝජනා ක්‍රම | ප්‍රාග්ධනය (රුපියල් දශ ලක්ෂ) | යෝජනා ක්‍රම | ප්‍රාග්ධනය (රුපියල් දශ ලක්ෂ) | යෝජනා ක්‍රම | ප්‍රාග්ධනය (රුපියල් දශ ලක්ෂ) |
| 201 සහ 203 | මස් එලවළු සහ පළතුරු සකසා කල් තබා ගැනීම .. | — | — | 2 | 0·37 | 1 | 0·15 | 1 | 1·53 |
| 202 | කිරි නිෂ්පාදිත නිපදවීම—කිරි ආහාර .. .. .. | — | — | — | — | — | — | 1 | 0·51 |
| 207 සහ 208 | කොකෝවා, චොකලට්, පැණිරස කෑම සහ හකුරු නිෂ්පාදනය .. .. .. .. .. | — | — | 5 | 4·06 | 2 | 0·44 | — | — |
| 209 | විවිධ ආහාර වර්ග නිෂ්පාදනය .. .. | — | — | 1 | 0·40 | — | — | — | — |
| 213 | බීම පෙරීම සහ රා සහ මෝල්ට්ඩ් නිෂ්පාදනය .. .. | — | — | 1 | 3·00 | 1 | 0·60 | — | — |
| 231—33 | ලනු, කඹ සහ නූල් ඇතුළු රෙදිපිළි නිෂ්පාදනය .. .. | — | — | 4 | 1·68 | 5 | 12·85 | 5 | 6·97 |
| 241 | පාවහන් නිෂ්පාදනය .. .. .. .. | 1 | 0·06 | — | — | 2 | 0·55 | — | — |
| 243 | පාවහන් හැර ඇඟ ලන ඇඳුම් .. .. .. | — | — | 1 | 0·26 | — | — | 2 | 1·07 |
| 271 | කඩදාසි, කඩදාසි බෝඩ් සහ පල්ප් මෝල් කඩදාසි බෝඩ් .. | — | — | 3 | 1·50 | — | — | 1 | 0·85 |
| 272 | කඩදාසි සහ පල්ප් භාණ්ඩ නිෂ්පාදනය .. .. .. | — | — | 1 | 0·30 | — | — | 1 | 0·10 |
| 300 | රබර් නිෂ්පාදිත නිෂ්පාදනය .. .. .. .. | — | — | — | — | — | — | 1 | 0·22 |
| 319 | පෝර ඇතුළු විවිධ නිෂ්පාදිත .. .. .. | — | — | 7 | 3·18 | 3 | 0·88 | 1 | 0·90 |
| 331—32 සහ 339 | මැටියෙන් හා වීදුරුවෙන් තැනූ භාණ්ඩ ඇතුළත් ලෝහ නොවන ඛණිජ නිෂ්පාදිත .. .. .. | — | — | 1 | 3·50 | — | — | 2 | 3·55 |
| 341 සහ 350 | ලෝහ නිෂ්පාදිත .. .. .. .. .. | — | — | 10 | 3·38 | 7 | 2·50 | 5 | 3·05 |
| 360 | විදුලි යන්ත්‍රෝපකරණහැර යන්ත්‍රෝපකරණ නිෂ්පාදනය .. | — | — | 4 | 1·72 | 1 | 1·00 | 1 | 3·00 |
| 370 | විදුලි උපකරණ, මෙවලම් හා භාණ්ඩ නිෂ්පාදනය.. .. | 1 | 1·00 | 6 | 4·92 | 4 | 3·00 | — | — |
| 383 | කොටස් ගෙන්වා මෝටර් රථ සවිකිරීම .. .. | — | — | — | — | 1 | 0·15 | — | — |
| 393 සහ 399 | වෙනත් තැනක සඳහන් නැති නිෂ්පාදන කර්මාන්ත .. | 1 | 0·65 | 8 | 1·35 | 7 | 2·22 | 3 | 1·08 |
| | එකතුව .. | 3 | 1·71 | 54 | 29·62 | 34 | 24·34 | 24 | 22.83 |

සංඛ්‍යා සටහන—II (i)–3

# 1961 මැයි—1962 දෙසැම්බර් කාලය තුළ අනුමත කැරුණු කුඩා ප්‍රමාණයේ කර්මාන්තවල ඇස්තමේන්තු ප්‍රාග්ධනය හා රැකියා

| අයි. එස්. අයි. සී. අංකය | කාර්මික වර්ගය | යෝජනා ක්‍රම | ප්‍රාග්ධනය (රු. දහස්) | රැකියා (ගණන) | යන්ත්‍රෝප කරණවල වටිනාකම (රු. දහස්) |
|---|---|---|---|---|---|
| 201 සහ 203 | මස්, එළවළු සහ පළතුරු සකසා කල් තබා ගැනීම | 6 | 283 | 59 | 178 |
| 207 සහ 208 | කොකෝවා, චොකලට්, පැණිරස කෑම සහ හකුරු නිෂ්පාදනය | 15 | 755 | 434 | 389 |
| 209 | විවිධ ආහාර වර්ග නිෂ්පාදනය | 13 | 699 | 403 | 290 |
| 213 | බීම පෙරීම සහ රා සහ මෝල්ටඩ් නිෂ්පාදනය | 1 | 112 | 45 | 55 |
| 220 | දුම්කොළ නිෂ්පාදනය | 3 | 460 | 208 | 345 |
| 231—33 | ලණු, කඹ සහ නූල් ඇතුළු රෙදිපිළි නිෂ්පාදනය | 32 | 2265 | 842 | 1439 |
| 241 | පාවහන් නිෂ්පාදනය | 7 | 520 | 133 | 279 |
| 243 | පාවහන් හැර ඇඟ ලන ඇඳුම් | 17 | 741 | 421 | 499 |
| 260 | ගෘහ භාණ්ඩ හා සවිකිරීම් උපකරණ | 4 | 291 | 69 | 155 |
| 272 | කඩදසි බෝඩ්, කඩදසි සහ පල්ප් භාණ්ඩ නිෂ්පාදනය | 8 | 417 | 100 | 316 |
| 280 | මුද්‍රණය, ප්‍රකාශනය හා සම්බන්ධිත කර්මාන්ත | 1 | 90 | 16 | 130 |
| 292 | හම් නිෂ්පාදිත නිෂ්පාදනය | 6 | 274 | 89 | 161 |
| 300 | රබර් නිෂ්පාදිත නිෂ්පාදනය | 5 | 504 | 168 | 180 |
| 311 සහ 319 | විවිධ රසායනික නිෂ්පාදිත නිෂ්පාදනය—පෝර ඇතුළුව | 47 | 2381 | 999 | 1308 |
| 331-32 සහ 339 | මැටි සහ වීදුරු භාණ්ඩ ඇතුළු ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත | 11 | 760 | 222 | 423 |
| 341 සහ 350 | ලෝහ නිෂ්පාදිත නිෂ්පාදනය | 26 | 2280 | 970 | 1159 |
| 360 | විදුලි යන්ත්‍ර හැර යන්ත්‍ර නිෂ්පාදනය | 7 | 776 | 324 | 444 |
| 370 | විදුලි යන්ත්‍ර සහ විදුලි භාණ්ඩ සහ උපකරණ නිෂ්පාදනය | 9 | 405 | 104 | 202 |
| 381 | නැව් තැනීම හා අලුත්වැඩියා කිරීම | 2 | 227 | 160 | 107 |
| 392-93 සහ 399 | වෙනත් තැනක සඳහන් නැති නිෂ්පාදන කර්මාන්ත | 52 | 3308 | 787 | 1766 |
| | එකතුව | 272 | 17,548 | 6,523 | 9,775 |

සංඛ්‍යා —පිළිගත් කර්මාන්ත ලෙස අනුමැතිය සඳහා කර්මාන්ත අමාත්‍යාංශයට එවුන අයැදුම් පත්වල තොරතුරු පදනම් කොට සැකසිණි.

සංඛ්‍යා සටහන II (i)—4

## 1961 මැයි—1962 දෙසැම්බර් අනුමැති කාලය අනුව වර්ග කැරුණු කුඩා ප්‍රමාණයේ කර්මාන්ත

| අයි. එස්. අයි. සී. අංකය | කාර්මික වර්ග | 1961 | | | | 1962 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | මැයි–ජූනි | | ජූලි–දෙසැම්බර් | | ජනවාරි–ජූනි | | ජූලි–දෙසැම්බර් | |
| | | යෝජනා ක්‍රම | ප්‍රාග්ධනය (රු. දහස්) | යෝජනා ක්‍රම | ප්‍රාග්ධනය (රු. දහස්) | යෝජනා ක්‍රම | ප්‍රාග්ධනය (රු. දහස්) | යෝජනා ක්‍රම | ප්‍රාග්ධනය (රු. දහස්) |
| 201 සහ 203 | මස් එළවළු සහ පළතුරු සකසා කල් තබා ගැනීම .. | — | — | — | — | 3 | 72 | 3 | 211 |
| 207 සහ 208 | කොකෝවා, චොකලට්, පැණිරස කෑම සහ හකුරු නිෂ්පාදනය | — | — | 2 | 110 | 9 | 310 | 4 | 335 |
| 209 | විවිධ ආහාර වර්ග නිෂ්පාදනය .. .. .. | — | — | 3 | 110 | 7 | 219 | 3 | 370 |
| 213 | බීම පෙරීම සහ රා සහ මෝල්ටඩ් නිෂ්පාදනය .. .. | — | — | — | — | 1 | 112 | — | — |
| 220 | දුම්කොළ නිෂ්පාදනය .. .. .. .. | — | — | — | — | 2 | 300 | 1 | 160 |
| 231—33 | ලනු, කඹ සහ නූල් ඇතුළු රෙදිපිළි නිෂ්පාදනය .. | — | — | 4 | 424 | 24 | 1491 | 4 | 350 |
| 241 | පාවහන් නිෂ්පාදනය .. .. .. .. | 1 | 15 | 4 | 215 | 1 | 80 | 1 | 210 |
| 243 | පාවහන් හැර ඇඟ ලන ඇඳුම් .. .. .. | — | — | 1 | 6 | 13 | 492 | 3 | 243 |
| 260 | ගෘහ භාණ්ඩ හා සවිකිරීම් උපකරණ .. .. .. | — | — | — | — | 3 | 266 | 1 | 25 |
| 272 | කඩදාසි බෝඩ්, කඩදාසි සහ පල්ප් භාණ්ඩ නිෂ්පාදන .. | — | — | — | — | 5 | 172 | 3 | 245 |
| 280 | මුද්‍රණය, ප්‍රකාශනය හා සම්බන්ධිත කර්මාන්ත .. .. | — | — | — | — | 1 | 90 | — | — |
| 292 | හම් නිෂ්පාදිත නිෂ්පාදනය .. .. .. .. | | | | | 3 | 61 | 3 | 213 |
| 300 | රබර් නිෂ්පාදිත නිෂ්පාදනය .. .. .. .. | | | | | 4 | 379 | 1 | 125 |
| 311 සහ 319 | විවිධ රසායනික නිෂ්පාදන නිෂ්පාදනය–පෝර ඇතුළුව .. | 1 | 3 | 17 | 694 | 18 | 845 | 11 | 839 |
| 331-32 සහ 339 | මැටි සහ වීදුරු ඇතුළු ලෝහ නොවන නිෂ්පාදිත නිෂ්පාදනය.. | — | — | 2 | 45 | 4 | 400 | 5 | 315 |
| 341 සහ 350 | ලෝහ නිෂ්පාදිත නිෂ්පාදනය .. .. .. | — | — | 6 | 570 | 9 | 975 | 11 | 735 |
| 360 | විදුලි යන්ත්‍ර හැර යන්ත්‍ර නිෂ්පාදනය .. .. .. | — | — | — | — | 7 | 776 | — | — |
| 370 | විදුලි යන්ත්‍ර සහ විදුලි භාණ්ඩ සහ උපකරණ නිෂ්පාදනය .. | — | — | 1 | 30 | 2 | 113 | 6 | 263 |
| 381 | නැව් තැනීම, හා අලුත් වැඩියා කිරීම .. .. .. | — | — | — | — | 2 | 227 | — | — |
| 392-3 සහ 399 | වෙනත් තැනක සඳහන් නැති නිෂ්පාදන කර්මාන්ත .. | — | — | 10 | 365 | 26 | 1776 | 16 | 1167 |
| | එකතුව .. | 2 | 18 | 50 | 2569 | 144 | 9156 | 76 | 5806 |

සංඛ්‍යා—පිළිගත් කර්මාන්ත ලෙස අනුමැතිය සඳහා කර්මාන්ත අමාත්‍යාංශයට එවුන අයැදුම්පත් වල තොරතුරු පදනම් කොට සැකැසිණි.